සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2023 ජූලි

## (201) උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය

(Advanced Financial Accounting & Costing)

2023-08-19
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.6 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, ගිණුම්කරණයේ මූලික සංකල්ප සම්බන්ධයෙන් නිවැරදි වන්නේ කුමක් ද?

(1) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය යන ඒවා පමණක් මූල්‍ය ප්‍රකාශනවල සංරචක වේ.

(2) වගකීමක් ව්‍යාපාරයට බැඳීමක් (obligation) ඇති කරනු ලබයි.

(3) බැඳීමක් නිරවුල් කිරීමේදී, මුදල් පිටතට ගලායාමක් පමණක් සිදු වේ.

(4) සියලු වත්කම්වලට භෞතික පැවැත්මක් තිබේ. (ලකුණු 02)

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, පිරිවැය ගිණුම්කරණය සම්බන්ධයෙන් නිවැරදි වන්නේ කුමක් ද?

(1) සෘජු අමුද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රම පිරිවැය සහ අනෙකුත් සෘජු පිරිවැයවලින්, ප්‍රාථමික පිරිවැය සමන්විත වේ.

(2) පිරිවැය ගිණුම්කරණයේදී ඓතිහාසික ගනුදෙනු හා සිදුවීම් පමණක් භාවිතයට ගනී.

(3) පිරිවැය, සෘජු පිරිවැය හා වක්‍ර පිරිවැය ලෙස එහි ස්වභාවය අනුව වර්ග කළ හැකිය.

(4) දැනටමත් දරා ඇති පිරිවැය, ආවස්ථික පිරිවැය ලෙස හඳුන්වනු ලැබේ. (ලකුණු 02)

**1.3** 2023 මාර්තු 31 දිනට, **නිශාන්ත ට්‍රේඩර්ස්** හි තොග ඒකක 1,000 ක් පැවතුණි. එදින වන විට එම තොග නිෂ්පාදනය කිරීම සඳහා **නිශාන්ත ට්‍රේඩර්ස්** විසින් රු.69,000/- ක පිරිවැයක් දරා තිබුණි. දැනට පවතින ආර්ථික තත්ත්වය මත ඒකකයකට රු.2/- බැගින් වන විකුණුම්වලට අදාල පිරිවැයක් දරා මෙම තොගය, ඒකකයක් රු.80/- කට විකිණීමට අපේක්ෂා කෙරේ.

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2023 මාර්තු 31 දිනට තොගවල ශුද්ධ උපලබ්ධි අගය [Net Realizable Value (NRV)] වනුයේ:

(1) රු.80,000/-. (2) රු.78,000/-. (3) රු.82,000/-. (4) රු.40,000/-.

(ලකුණු 02)

**1.4** මූල්‍ය ප්‍රකාශනවල වාර්තාකරන දිනට පසු නමුත්, මූල්‍ය ප්‍රකාශන සඳහා අනුමැතිය ලබාදීමට පෙර සිදුවී ඇති පහත සඳහන් සිදුවීම් සලකන්න. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 10 - වාර්තාකරන කාලපරිච්ඡේදයට පසු සිදුවීම් අනුව, ගැලපිය යුතු සිදුවීමක් වන්නේ පහත සඳහන් ඒවායින් කුමක් ද?

(1) තොගවලින් කොටසක්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තාකර ඇති අගයට වඩා අඩු අගයකට විකිණීම.

(2) මෙහෙයුම් කටයුත්තක් නවතා දැමීම සඳහා වූ සැලැස්මක් නිවේදනය කිරීම.

(3) ප්‍රධාන නිෂ්පාදන පිරියතයක් ගින්නක් නිසා විනාශ වීම.

(4) සාමාන්‍ය කොටස්හිමියන් සඳහා ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම. (ලකුණු 02)

**1.5** හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න:

**(a)** ලිඛිත ගිවිසුමක් නොමැතිව හවුල් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට නොහැක.

**(b)** හවුල් ව්‍යාපාරයක සිටිය හැකි උපරිම හවුල්කරුවන්ගේ සංඛ්‍යාව 50 ක් විය යුතුය.

**(c)** හවුල් ව්‍යාපාරයක් පොදුවේ ලාභ අරමුණක් ඇතිව ව්‍යාපාරයක් ක්‍රියාත්මක කරයි.

**(d)** හවුල් ව්‍යාපාරයට නෛතික පුද්ගලභාවයක් ඇත.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, හවුල් ව්‍යාපාරයකට අදාලව නිවැරදි ප්‍රකාශ / ප්‍රකාශය වන්නේ කුමක් ද?

(1) **(a)** පමණි. (2) **(c)** පමණි.

(3) **(a)** සහ **(c)** පමණි. (4) **(b), (c)** සහ **(d)** පමණි. (ලකුණු 02)

**1.6** **සීමාසහිත රංග (පෞද්ගලික) සමාගම,** එකතුකල අගය මත බදු [Value Added Tax (VAT)] සඳහා ලියාපදිංචි සමාගමකි. පහත සඳහන් තොරතුරු 2023 මාර්තු මාසයට අදාල වේ:

| | **රු.** |
|---|---:|
| 2023 මාර්තු 01 දිනට එකතුකල අගය මත බදු පාලන ගිණුමේ බැර ශේෂය | 125,000 |
| විකුණුම් (එකතුකල අගය මත බදු රහිත) | 6,000,000 |
| විකුණුම් ආපසු එවුම් (එකතුකල අගය මත බදු රහිත) | 240,000 |
| ගැනුම් (එකතුකල අගය මත බදු රහිත) | 4,800,000 |

*(සියලුම ගැනුම් හා විකුණුම් සඳහා බදු ඉන්වොයිසි පවතින අතර, අදාල වන එකතුකල අගය මත බදු අනුපාතිකය 15% කි.)*

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2023 මාර්තු 31 දිනට ගෙවිය යුතු එකතුකල අගය මත බදු අගය වනුයේ:

(1) රු.341,000/-. (2) රු.305,000/-. (3) රු.19,000/-. (4) රු.269,000/-.

(ලකුණු 02)

*අංක 1.7 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.7** පිරිවැය ගිණුම්කරණයෙහි අරමුණු තුනක්(03) සඳහන් කරන්න. (ලකුණු 03)

**1.8** "සංකලිත ගිණුම්කරණ පද්ධතියක්" (Integrated Accounting System) සහ "අසංකලිත ගිණුම්කරණ පද්ධතියක් " (Non-Integrated Accounting System) අතර වෙනස සඳහන් කරන්න. (ලකුණු 03)

**1.9** **A නිෂ්පාදිතය** සම්බන්ධයෙන් **සරණ ට්‍රේඩර්ස්** හි ගිණුම් පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

| | |
|---|---|
| වාර්ෂික ඉල්ලුම | ඒකක 30,000 |
| සාමාන්‍ය තොගය | ඒකක 10,000 |
| ආර්ථික ඇණවුම් ප්‍රමාණය [Economic Order Quantity (EOQ)] | ඒකක 5,000 |

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, වර්ෂයකට **A නිෂ්පාදිතය** සඳහා ඇණවුම් කළ යුතු ප්‍රශස්ත ඇණවුම් ගණන, ගණනය කරන්න. (ලකුණු 03)

**1.10** 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වැනි වගන්තියට අනුව, පහත සඳහන් එක් එක් ඒවාට අදාල ප්‍රතිපාදනය සඳහන් කරන්න:

(a) ව්‍යාපාරය කළමනාකරණය කිරීම.

(b) ව්‍යාපාරයට ප්‍රාග්ධනය යෙදවීම.

(c) නව හවුල්කරුවෙකු බඳවා ගැනීම.

(d) හවුල්කරුවෙකු විසින් හවුල් ව්‍යාපාරයට ලබාදුන් ණය මුදලක් සඳහා වන පොලිය. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

## 02 වන ප්‍රශ්නය

ආටිගලට අයත් **ෆයින් ප්‍රින්ට්ස්** නම් වූ මුද්‍රණ ආයතනයේ පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

(1) **ෆයින් ප්‍රින්ට්ස්** හි බැංකු ශේෂය හැර වත්කම් හා වගකීම් පහත සඳහන් පරිදි වේ:

*(රු.'000)*

| | 2022.12.31 දිනට | 2022.01.01 දිනට |
|---|---|---|
| මුද්‍රණ යන්ත්‍රවල ධාරණ අගය | 1,200 | 1,500 |
| තොගය - ලිපිද්‍රව්‍ය | 30 | 32 |
| ඉදිරියට කළ කුළී ගෙවීම් | 20 | 10 |
| උපචිත විදුලි වියදම් | 7 | 5 |
| ලිපිද්‍රව්‍ය සැපයුම්කරුවන් සඳහා වන ගෙවිය යුතු මුදල් | 18 | 15 |

(2) 2022 ජනවාරි 01 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ **ෆයින් ප්‍රින්ට්ස්** හි බැංකු ගිණුම හරහා සිදුවූ ගනුදෙනුවල සාරාංශය පහත දැක්වේ:

| | **රු.'000** |
|---|---:|
| ලැබීම්: | |
| මුදල් තැන්පතු | 1,825 |
| ගෙවීම්: | |
| ලිපිද්‍රව්‍ය සැපයුම්කරුවන්ට | 1,200 |
| විදුලිය | 65 |
| කුලිය | 130 |
| දුරකතන වියදම් | 24 |

2022 දෙසැම්බර් 31 දිනට රු.220,000/- ක බැංකු අයිරාවක්, සමාගමේ වාර්තා විය.

(3) දෛනිකව රු.1,500/- බැගින් ගෙවීම් සිදුකරනු ලබන සේවකයින් දෙදෙනෙක් ආයතනයේ සේවය කරති. වැටුප් සඳහා වන ගෙවීම් සිදුකිරීමෙන් පසුව, මුද්‍රණ සේවා මගින් එකතු කරගන්නා ලද මුදල් දවස අවසානයේදී බැංකුවේ තැන්පත් කරනු ලබයි. 2022 වර්ෂයේදී ආයතනය දවස් 240 ක් මෙහෙයුම් කටයුතු සිදුකරන ලදී. වැටුප් හැරුනුකොට අනෙකුත් සියලුම ගෙවීම් බැංකු ගිණුම හරහා සිදුකරනු ලබයි.

(4) සියලුම විකුණුම් මුදල් පදනම මත සිදුකරනු ලබන අතර, සියලුම ලිපිද්‍රව්‍ය මිලට ගැනුම් ණය පදනම මත සිදුකරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2022 ජනවාරි 01 දිනට, **ෆයින් ප්‍රින්ට්ස්** හි ප්‍රාග්ධන (ස්කන්ධය) ශේෂය **ගණනය කරන්න**. (ලකුණු 03)

(b) 2022 දෙසැම්බර් 31 දිනට **ෆයින් ප්‍රින්ට්ස්** හි ශුද්ධ ලාභය **ගණනය කරන්න** (ලකුණු 07)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

ත්‍රිකුණාමලයේ රාවණා විද්‍යාලයට අයත් පිහිනුම් තටාකයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා 2022 ජනවාරි මාසයේදී **බ්ලූ වේල් පිහිනුම් සමාජය** පිහිටුවන ලදී.

2022 වර්ෂය තුළදී **බ්ලූ වේල් පිහිනුම් සමාජයේ** මෙහෙයුම් කටයුතුවලට අදාලව පහත සඳහන් තොරතුරු පොත්වලින් උපුටාගෙන ඇත:

**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් සහ ගෙවීම් ගිණුම** *(රු.)*

| | | | |
|---|---:|---|---:|
| සාමාජික මුදල් | 630,000 | විදුලි වියදම් | 96,000 |
| පිහිනුම් පන්තිවලින් ලද අයභාරය | 325,000 | ජල හා රසායන ද්‍රව්‍ය වියදම් | 180,000 |
| පිහිණුම් තරඟය සඳහා වූ අනුග්‍රාහක දැන්වීම් | 220,000 | පිරිසිදු කරන්නන්ගේ වැටුප | 312,000 |
| පිහිනුම් තරඟය සඳහා වූ ඇතුලත්වීමේ ගාස්තු | 25,000 | පිහිණුම් තරඟය සඳහා වූ වියදම් | 58,000 |
| විශේෂ පරිත්‍යාග | 250,000 | පිහිණුම් පුහුණුකරුවන් සඳහා ගාස්තු | 265,000 |
| | | කුලිය | 84,000 |
| | | පිහිණුම් තටාක උපකරණ | 360,000 |
| | | වෙනත් වියදම් | 27,000 |
| | | 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය ප/ගෙ | 68,000 |
| | **1,450,000** | | **1,450,000** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) වාර්ෂික සාමාජික ගාස්තුව රු.7,500/- ක් වේ. 2022 වර්ෂය තුළදී සාමාජිකයින් 78 දෙනෙක් විසින් සමාජයේ සාමාජිකත්වය ලබාගන්නා ලදි. 2022 වර්ෂය සඳහා වන සාමාජික ගාස්තු ලැබීම් පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ:

| | |
|---|---|
| 2022 වර්ෂය සඳහා ගෙවූ | සාමාජිකයින් 74 |
| 2023 වර්ෂය සඳහා ගෙවූ | සාමාජිකයින් 10 |

(2) පිහිණුම් තටාක උපකරණ පිහිණුම් සමාජය විසින් 2022 ජූනි 01 දින මිලට ගන්නා ලද අතර, ඒවා වසර 3 ක කාලයක් භාවිත කිරීමට අපේක්ෂා කෙරේ.

(3) විශේෂ පරිත්‍යාග ලැබීම්, ප්‍රවර්තන ගිණුම්කරණ වර්ෂය සඳහා අදාල වේ.

(4) 2022 දෙසැම්බර් මාසය සඳහා වන රු.9,000/- ක විදුලි බිල්පත සඳහා 2023 ජනවාරි මාසයේදී ගෙවීම් කරන ලදි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**

(a) සාමාජික ගාස්තු ගිණුම. (ලකුණු 02)

(b) ආදායම් සහ වියදම් ගිණුම. (ලකුණු 08)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

**වාතක** සහ **මාලක** යනු ලාභ'ලාභ සමසමව බෙදාගන්නා ඉදිකිරීම් ද්‍රව්‍ය විකුණුම්හලක් වන **C & M හාඩ්වෙයාර්** හි හවුල්කරුවෝ වෙති. 2022 අප්‍රේල් 01 දින, රු.3,000,000/- ක මූලික ප්‍රාග්ධන ආයෝජනය සමඟ නව හවුල්කරුවෙකු ලෙස **නුවන්,** හවුල් ව්‍යාපාරයට බඳවාගන්නා ලදි.

(1) හවුල් ගිවිසුමෙහි පහත දෑ සඳහන් වේ:

- ප්‍රාග්ධන ගිණුම්වල ආරම්භක ශේෂය මත 5% පොලියක් ලැබීමට හිමිකම් ඇත.
- ව්‍යාපාරයෙහි පරිපාලන කටයුතුවල නිරතවීම වෙනුවෙන් **වාතක** ට මාසිකව රු.50,000/- ක වේතනයක් ලැබීමට හිමිකමක් ඇත.
- ලාභ'ලාභ, **වාතක, මාලක** සහ **නුවන්** අතර, පිළිවෙලින් 2:3:1 අනුපාතය යටතේ බෙදාගත යුතුය.
- හවුල්කරුවන් විසින් හවුල් ව්‍යාපාරයට ලබා දී ඇති ණය වෙනුවෙන් 10% ක වාර්ෂික පොලියක් හිමි වේ.

(2) 2022 අප්‍රේල් 01 දිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු.2,400,000/- ක් ලෙස අගය කර ඇත. කීර්තිනාම ගිණුමක් විවෘත නොකර එය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හරහා ගැලපීමට තීරණය කර ඇත.

(3) පහත සඳහන් ශේෂයන් හවුල්ව්‍යාපාරයෙන් උපුටාගෙන ඇත: *(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| 2022 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම් - **වාතක** | | 3,200 |
| **මාලක** | | 4,800 |
| 2022 අප්‍රේල් 01 දිනට ජංගම ගිණුම් - **වාතක** | 1,200 | |
| **මාලක** | | 2,300 |
| **නුවන්** යෙදවූ ප්‍රාග්ධනය | | 3,000 |
| ගැනිලි - **වාතක** | 200 | |
| - **මාලක** | 150 | |
| 2022 අප්‍රේල් 01 දින **මාලක** විසින් ලබා දුන් ණය | | 200 |

(4) **මාලක** විසින් හවුල් ව්‍යාපාරයට ලබාදුන් ණය සඳහා වන පොලිය ගැලපීමට පෙර හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු.4,770,000/- ක් විය.

(5) වර්ෂය තුළදී **මාලක** විසින් ලබාදුන් ණය වෙනුවෙන් කිසිදු ණය ආපසු ගෙවීමක් සිදුකර නොමැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **C & M හාඩ්වෙයාර්** හි පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්. (ලකුණු 04)

(b) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## **05** වන ප්‍රශ්නය

(A) **සීමාසහිත තුවන් (පෞද්ගලික) සමාගම,** අසංකලිත ගිණුම්කරණ පද්ධතියක් භාවිත කරයි. 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිරිවැය ගිණුම්වලට අනුව ලාභය රු.450,000/- ක්ද, මූල්‍ය ගිණුම්වලට අනුව ලාභය රු.409,000/- ක්ද විය.

වෙනස සඳහා වූ හේතු පහත සඳහන් පරිදි වේ:

(1) තොග අගය කිරීම: *(රු.)*

| | **පිරිවැය ගිණුම්වලට අනුව** | **මූල්‍ය ගිණුම්වලට අනුව** |
|---|---|---|
| ආරම්භක තොගය | 47,500 | 52,500 |
| අවසාන තොගය | 122,500 | 143,500 |

(2) අධ්‍යක්ෂ ගාස්තු වූ රු.50,000/- මූල්‍ය ගිණුම්වල පමණක් අයකර ඇත.

(3) ක්ෂයවීම්, පිරිවැය ගිණුම්වලට අනුව රු.245,000/- ක්ද, මූල්‍ය ගිණුම්වලට අනුව රු.300,000/- ක්ද විය.

(4) ස්ථාවර තැන්පතු මත වන පොලී ආදායම වන රු.48,000/- මූල්‍ය ගිණුම්වල පමණක් සලකා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

මූල්‍ය ගිණුම් සහ පිරිවැය ගිණුම් අතර, ලාභ සංසන්දනය කිරීමේ ප්‍රකාශනයක් **පිළියෙල කරන්න**. (ලකුණු 05)

(B) **A නිෂ්පාදිතයට** අදාලව 2023 ජූනි මාසය සඳහා වන පහත සඳහන් තොරතුරු **සීමාසහිත RAM සමාගමෙන්** උපුටාගෙන ඇත:

| **දිනය** | **විස්තරය** | **ප්‍රමාණය (ඒකකවලින්)** | **ඒකකයක මිල (රු.)** |
|---|---|---|---|
| 2023.06.01 | ආරම්භක ශේෂය | 220 | 670 |
| 2023.06.10 | ගැනුම් | 500 | 619.60 |
| 2023.06.15 | නිකුත් කිරීම් | 600 | - |
| 2023.06.20 | ගැනුම් | 200 | 690 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

භරිත සාමාන්‍ය මිල ක්‍රමය [Weighted Average Cost (WAC)] යොදා ගනිමින්, **A නිෂ්පාදිතය** සඳහා තොග ලෙජරය **පිළියෙල කරන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

(A) **සීමාසහිත සැම් (පෞද්ගලික) සමාගමේ, Y නිෂ්පාදිතය** ට අදාලව පහත සඳහන් තොරතුරු ඔබ වෙත ලබාදී ඇත:

| | |
|---|---|
| වාර්ෂික ඉල්ලුම | ඒකක 180,625 |
| ඒකකයක ගැනුම් මිල | රු.12.50 |
| භාවිතය | ඒකක 2,000 - 10,000 |
| ඒකකයක වාර්ෂික රඳවා ගැනීම් පිරිවැය | ඒකකයක මිලෙන් 20% |
| ඇණවුම් පිරිවැය | ඇණවුමකට රු.500/- බැගින් |
| පොරොත්තු කාලය | මාස 2 - 4 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත දෑ **ගණනය කරන්න**:

(a) ආර්ථික ඇණවුම් ප්‍රමාණය [Economic Order Quantity (EOQ)]. (ලකුණු 03)

(b) යළි ඇණවුම් මට්ටම (Re-order Level). (ලකුණු 01)

(c) අවම තොග මට්ටම. (ලකුණු 02)

(B) **සීමාසහිත X සමාගමේ, කාර්යය අංක 9000** ට අදාලව පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

| | |
|---|---|
| සෘජු අමුද්‍රව්‍ය | කිලෝග්‍රෑමයක් රු.250/- බැගින් කිලෝග්‍රෑම් 250 |
| සෘජු ශ්‍රමය | පැයකට රු.1,000/- බැගින් පැය 125 |
| නිෂ්පාදන පොදුකාර්ය - **A** දෙපාර්තමේන්තුව | සෘජු ශ්‍රම පිරිවැයෙන් 200% |
| - **B** දෙපාර්තමේන්තුව | සෘජු ශ්‍රම පිරිවැයෙන් 75% |

සමාගම විකුණුම් මිලෙන් 20% ක ලාභයක් පවත්වා ගනී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**කාර්යය අංක 9000** මත අයකළ යුතු මිල **ගණනය කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 25)

## 07 වන ප්‍රශ්නය

**සීමාසහිත වින් වර්ල්ඩ් (පෞද්ගලික) සමාගමේ** 2023 මාර්තු 31 දිනට, ශේෂ පිරික්සුම පහත පරිදි වේ:

| | හර (*රු.'000*) | බැර (*රු.'000*) |
|---|---|---|
| 2022 අප්‍රේල් 01 දිනට, ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 1,200,000) | | 4,800 |
| 2022 අප්‍රේල් 01 දිනට, රඳවාගත් ඉපැයීම් | | 10,614 |
| **පිරියත සහ උපකරණ, පිරිවැයට:** | | |
| මෝටර් වාහන | 10,000 | |
| කාර්යාල උපකරණ | 5,550 | |
| **2022 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය:** | | |
| මෝටර් වාහන | | 5,000 |
| කාර්යාල උපකරණ | | 2,220 |
| 25% බැංකු ණය (2022 අප්‍රේල් 01 දින ලබාගත්) | | 4,650 |
| බැංකුවේ ඇති මුදල් | 3,511 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 6,280 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 1,559 |
| 2023 මාර්තු 31 දිනට තොගය | 650 | |
| විකුණුම් | | 20,825 |
| විකුණුම් පිරිවැය | 6,047 | |
| කාර්යාල කුලිය | 725 | |
| ඉන්ධන වියදම් | 426 | |
| ප්‍රචාරණ හා අලෙවිකරණ වියදම් | 1,182 | |
| විකුණුම් කොමිස් වියදම් | 926 | |
| ජලය සහ විදුලිය | 132 | |
| කාර්යාල නඩත්තු වියදම් | 372 | |
| වැටුප්, වේතන, සේවක අර්ධසාධක අරමුදල් සහ සේවක භාර අරමුදල් | 7,697 | |
| බැංකු ගාස්තු | 18 | |
| 22% වාර්ෂික පොළී අනුපාතයට ස්ථාවර තැන්පතු (2022 අප්‍රේල් 01 දින ආයෝජනය කළ) | 10,000 | |
| අනෙකුත් පරිපාලන වියදම් | 296 | |
| 2022 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය | | 125 |
| ගෙවූ ආදායම් බදු | 55 | |
| ගෙවිය යුතු සේවක අර්ධසාධක අරමුදල් (EPF) සහ සේවක භාර අරමුදල් (ETF) | | 74 |
| වෙනත් ආදායම් | | 4,000 |
| | **53,867** | **53,867** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) වර්ෂය තුළදී සමාගම විසින් 2022 අප්‍රේල් 01 දිනට සිටි සියලුම කොටස්හිමියන් වෙත සෑම කොටස් 20 ක් සඳහා එක් කොටසක් බැගින් වන පරිදි කොටසක මිල රු.60/- බැගින් වූ හිමිකම් නිකුතුවක් සිදුකරන ලදී. සියලුම කොටස්හිමියන් විසින් හිමිකම භාවිතකරන ලද අතර, ඔවුන් සියලු දෙනාගෙන්ම මුදල් වර්ෂය තුළ එකතු කරගන්නා ලදී. ලැබූ මුදල්, මුදල් ගිණුමට හර කර වෙනත් ආදායම් ගිණුමට බැර කරන ලදී. ඒ හැර මේ සම්බන්ධයෙන් වෙනත් කිසිදු සටහනක් තබා නොමැත.

(2) 2023 මාර්තු 31 දිනට, ගෙවිය යුතු කුලිය රු.50,500/- ක් වූ අතර, ඉදිරියට කළ විදුලි වියදම රු.13,500/- ක් විය.

(3) පිරියත සහ උපකරණ, සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත ක්ෂය කරනු ලබන අතර, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ:

| | |
|---|---|
| මෝටර් වාහන | වර්ෂ 4 |
| කාර්යාල උපකරණ | වර්ෂ 5 |

(4) 2022/23 තක්සේරු වර්ෂය සඳහා වන ඇස්තමේන්තුගත ආදායම් බදු වගකීම රු.207,000/- කි. වර්ෂය තුළදී කාර්තුමය ආදායම් බදු වාරික වශයෙන් සමාගම විසින් රු.55,000/- ක් ගෙවන ලදී.

(5) 2023 මාර්තු 25 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, රු.7,500,000/- ක මුදලක් රඳවාගත් ඉපයීම්වලින් පොදු සංචිත ගිණුමට මාරු කිරීමට අධ්‍යක්ෂකවරු අනුමත කරන ලදී.

(6) 2023 මාර්තු 31 දිනට පැවති වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂයෙන් 10% ක, වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනයක් පවත්වාගෙන යාමට සමාගමේ කළමණාකාරිත්වය විසින් තීරණය කර ඇත.

(7) ස්ථාවර තැන්පතු මත ලැබිය යුතු පොලී හා බැංකු ණය මත වන ගෙවිය යුතු පොලී, ගිණුම් පොත්වල වාර්තාකර නොමැත. වර්ෂය තුළදී කිසිදු ණය ආපසු ගෙවීමක් සිදුකර නොමැත.

(8) මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම් සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2023 ජුනි 10 දින ලබා දී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත වින් වර්ල්ඩ් (පෞද්ගලික) සමාගමේ** කළමනාකාරිත්වයේ භාවිතය සඳහා, පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ/'ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 13)

(b) 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 12)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

## කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැළකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |